<u>තිරප්පනේ ප්‍රාදේශීය සභාව</u>

**<u>2022.08.10 වන දින පෙ.ව 10.00ට පැවති මහ සභා රැස්වීම.</u>**

***<u>පැමිණ සිටි ගරු මන්ත්‍රීවරුන්:</u>***

1. ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා - ගරු සභාපතිතුමා
2. ඒ.ජී.මරියහාමි මැතිනිය - ගරු උපසභාපතිතුමිය
3. ඒ. අන්වර් සදාක් මැතිතුමා - ගරු සභික තුමා
4. එස්.තිස්ස විජේසිංහ මැතිතුමා - ගරු සභික තුමා
5. එච්.එම්.නාසිම් මැතිතුමා - ගරු සභික තුමා
6. ජී.නිමල් රාජපක්ෂ මැතිතුමා - ගරු සභික තුමා
7. බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා - ගරු සභික තුමා
8. ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා - ගරු සභික තුමා
9. එන්.රශ්මි සංකල්පනා මැතිනිය - ගරු සභික තුමිය
10. කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය - ගරු සභික තුමිය
11. ජේ.රෝහණ විජේතිලක මැතිතුමා - ගරු සභික තුමා
12. ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා - ගරු සභික තුමා

***<u>නොපැමිණි ගරු මන්ත්‍රීවරුන් :</u>***

1. පී.මධුර කුමාර පියරත්න මැතිතුමා - ගරු සභික තුමා
2. එච්.බී.නලින් හේරත් මැතිතුමා - ගරු සභිකතුමා
3. ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය - ගරු සභික තුමිය
4. ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා - ගරු සභික තුමා

***<u>සහභාගී වූ නිළධාරීන් ;</u>***

1. ආර්.පී.පී. රේණුකා ලියනගේ මිය - ලේකම්
2. එම්.ආර්.ඩබ්.සී.කේ.රණවීර මිය - විෂය ලිපිකරු

**<u>(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.</u>**

**- <u>2022.07.19 දින පැවති ගරු මහා සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.</u>**

අද දිනට නියමිත ගරු මහා සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2022.07.19 දින පැවති ගරු මහ සභා වාර්තාව සභා සම්මත කර ගැනීමයි.ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 127 - 08-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි,ගරු මහ සභාවෙන් අවසරයි. 2022.07.19 දින පැවති ගරු මහා සභා වාර්තාව සත්‍ය හා නිවැරදි බවට මම යෝජනා කරනවා.

**<u>ගරු සභික - එන්.රශ්මි සංකල්පනා මිය මැතිනිය.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2022 ජූලි මස 19 වන දින පැවති ගරු මහාසභා වාර්තාව පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

විශේෂ නිවේදන යටතේ මට කියන්න තියෙන්නේ අද දිනය ශෝකයට පත්වන දවසක්. සභා කටයුතු විෂය භාරව සිටි කාර්යාලයේ සියළු රාජකාරී කැපවීමෙන් කළ අක්ෂිලා මිය දැඩි අසනීප තත්වයකට ගොදුරු වී සිට ඊයේ දිනයේදී අභාවයට පත් වුනා.මේ පිළිබඳව මගේ කණගාටුව සහ ශෝකය ප්‍රකාශ කරමි.

ඒ වගේම ඉදිරි වසර අපට ඉතාමත් අභියෝගාත්මක වසරක් ප්‍රාදේශීය සභාවල ධූර කාලය අවසන් කරනවා කියලා පුවත්පත් වල පල වෙලා තියෙනවා. ඒ නිසා ඉදිරියේදී මැතිවරණයක් තියේවි.ඒ නිසා ඔබ තුමාලගේ පක්ෂ වල ජය තහවුරු කර ගන්න කටයුතු කරගන්න වෙයි. මේ මාස කිහිපය තුළ ජනතාවට උපරිම සේවාව සලසන්න.ඉදිරි වසර සඳහා අය වැය සකස් කිරීමේ කටයුතු වලට සියළු දෙනාම සයහාගී වෙන්න. ගියවර සාකච්ඡාවට සහභාගී වීමට නොහැකි වූ අය ඊලග අයවැය සාකච්ඡාවට සම්බන්ධ වෙන්න. පසුගිය වසරේ ක්‍රියාත්මක කල සංවර්ධන ව්‍යාපෘති වල සල්ලි ලැබෙන්න තියෙනවා.මෙතෙක් කල් මුදල් ආවේ නැති එක ලොකු ගැටලුවක් මට ආණ්ඩුකාර් තුමා කිව්වා මුදල් නොලැබුනු ව්‍යාපෘති වල ලැයිස්වක් සකසලා එවන්න කියලා.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහා සභාවට ඉදිරිපත් කිරීම.**

1. ඒ අනුව ආදායම් පරීක්ෂක මහත්මා විසින් 2022 ජූලි මස ආදායම් වාර්තාව ඉදිරිපත් කර සිටිනවා.ඒ අනුව ජූලි මස ආදායම ලෙස රු.357,490.00 ක මුදලක් ආදායම් පරීක්ෂක මහතා විසින් එකතු කර තිබෙනවා.එයද දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.
2. කඩ කාමර විවෘත කිරීම සම්බන්ධයෙන් ඇතුන්ගම හා ගල්කුලම කඩහිමියන්ට යවන ලද ලිපිය දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.
3. තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ සභිකවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීම සම්බන්ධයෙන් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යවන ලද ලිපිය දැන ගැනීම සඳහා ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**

**ලිපි අංක I.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ජාතික අයවැයචක්‍ර ලේඛ අංක 03/2022 - රාජ්‍ය වියදම් පාලනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් එවා ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීම සඳහා ඉදිරිපත් කර සිටිනවා.
මෙම ලිපිය පොදුවේ සියළු ප්‍රාදේශීය සභා වලට එවපු ලිපියක් මේ ලිපියේ තියෙන්නේ ආදායම් උත්පාදනය කිරීම සඳහා වන යෝජනා ඉදිරිපත් කරන්න කියලා .

**යෝජනා අංක 128 - 08-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

තිරප්පනේ ප්‍රාදේශීය සභාව කියන්නේ ආදායම් අඩු ප්‍රාදේශීය සභාවක් ලංකාවටත් වෙලා තියෙන්නේ මේකමයි. මෙම තත්ත්වය මඟ හරවා ගැනීම අප සියළු දෙනාගේම වගකීමක් සහ යුතුකමක් සභාවේ ආදායම වැඩි වුනාම හුදෙක් ජනතාවගේ සුභ සාධනය දියුණු වෙනවා. මේ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරල තුරු සෙවණ තුළ හෙල බොජුන්හලක් ඉදි කිරීම සහ නේවාසික පහසුකම් ලබා දීමට හැකිවන පරිදි පැරණි තානායම අළුත් වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

කේ.බී.අක්ෂිලා සුජීවනි බණ්ඩාර මහත්මිය අප අතරින් සමුගැනිම සම්බන්ධයෙන් මාගේ කණගාටුව ප්‍රකාශ කරනවා.ලංකාව ආර්ථික ස්වයංපෝෂිත බවෙන් කඩා වැටුනේ නෑ.මේ සියළු දෙවල් වෙලා තියෙන්නේ දූෂණ හා අක්‍රමිකතා නිසා.අයට ඒ සඳහා ප්‍රමාණවත් තොරතුරු තියෙනවා.මේ දක්වා ප්‍රාදේශීය සභාවකින් රජයකට කිසිම යෝජණාවක් මේ දක්වා ඉදිරිපත් වෙලා නෑ.දූෂණ හා අක්‍රමිකතා වලින් ගත්ත මුදල් නැවන ආපසු ගන්න කටයුතු කරමු කියන යෝජණාව මම ඉදිරිපත් කරනවා.ඒ වගේම ග්‍රාමීය ශ්‍රමය යොදාගෙන ගොවිපලක් කරගෙන යමු කියන යෝජණාවද මම ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

රෝහණ මන්ත්‍රීතුමාගේ අදහසත් හොඳයි. ඒ වගේම සභාවට වියදම් පාලනය කරන්න පුලුවන්.පාලනය කල හැකි වියදම් අඩු කර ගමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සියලුදෙනාගෙන්ම අවසරයි.ඉහත යෝජනා සියල්ල ඇතුළත් කරලා තිස්ස මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව මම ස්ථිර කරමි.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

වියදම් කප්පාදු කිරීමේ යෝජණා තමා මේකේ එවන්න කියලා තියෙන්නේ.ගියවර යෝජනාවලට ඇතුලත් කරලා මේ යෝජනා යවමු.මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**ලිපි අංක - I .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

තක්සේරු නිලධාරියෙකුගේ සහාය ලබා ගන්නා තුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ සහ කාර්යාලයේ නිලධාරින් දෙදෙනෙකු ලවා පහත සඳහන් ස්ථාන සඳහා තාවකාලික තක්සේරුවක් සිදු කර ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවට සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කරමි.

- දයාගම හංදියේ නව කඩ කාමර
- ඇතුන්ගම හංදියේ නව කඩ කාමර
- තිරප්පනේ නගරයේ නව කඩ කාමර
- තුරු සෙවන උද්‍යානය
- තිරප්පනේ පාසල ඉදිරිපිට උද්‍යානය

තක්සේරු දෙපාර්තුමෙන්තුවට මේ සම්බන්ධයෙන් කතා කළා.මේ දින වල තක්සේරු නිළධාරින් නෑ කියලා දැනුම් දුන්නා.ඒ නිසා තාක්ෂණික නිළධාරියෙකු ඇතුළුව අභ්‍යන්තර නිළධාරින් තුන්දෙනෙක් දාලා තාවකාලික තක්සේරුවක් කර ගමු.තක්සේරු නිළධාරින් යොදා ගෙන පසුව තක්සේරුව සිදු කරගමු.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

ස්ථිරවම තක්සේරු කරලා ගන්වා නම් හොඳයි. නැතිනම් ධූර කාලය අවසන් උනාම ගැටලුවක් වේවි.

**යෝජනා අංක 129 - 08-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

නිශ්චිත තක්සේරුකරුවෙක් අපට අවශ්‍ය නෑ.දීර්ඝ කාලයක් කරන්න කාර්යයක් නෑ.තාවකාලික තක්සේරු නිලධාරියෙක් ලබා ගෙන, ඒ අනුව අදාළ තක්සේරුව තාක්ෂණික නිළධාරියෙක් ඇතුළුව අභ්‍යන්තර නිළධාරින් තුන්දෙනෙක් දාලා තක්සේරුව සිදු කර නැවත තක්සේරු නිලධාරියෙකුගේ සේවය ලබා ගෙන අදාළ තක්සේරුව සිදු කිරීම සුදුසු බවට මම යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - II .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ගල්කුලම කඩකාමර අංක 01 සම්බන්ධයෙන් වැව පාර,ගල්කුලම,අනුරාධපුර ලිපිනයේ පදිංචි රංජිත් වසන්ත සිරිවර්ධන මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා. මේ ලිපිය කාර්මික කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මහා සභාවට ඉදිරිපත් කරලා තියෙනවා.

**යෝජනා අංක 130 - 08-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

මෙම ලිපිය සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරි මහතා දැනුවත් නෑ.ගල්කුලම කඩ කාමර භාගයක් අළුත්වැඩියා කලා.හිඟ මුදල් ගෙවලා මේ අය කඩ කාමර ලබා ගත්තා. හිඟ මුදල් කපා ගන්න අවුරුදු 2,3 ගතවෙනවා. මේ තුළින් සභාවේ ආදායම අඩු වෙනවා. ඒ වගේම තාක්ෂණික නිලධාරි ලවා ඇස්තමේන්තුවක් සිදු කරවා ගෙන ඉතාමත් අත්‍යවශ්‍ය අළුත්වැඩියාවන් කරලා කුලියෙන් 50% අඩු කිරීම සුදුසු බව මම යෝජනා කරනවා. අපි මේ කාලය තුළ කඩ කාමරවල තිබ්බ ප්‍රශ්ණ වලින් 80% ක් විතර නිවැරදි කළා.ගල්කුලම කඩකාමරවල බදු හිමියන් හිඟ මුදල් ගෙවලා ඒ අය කඩේ ගත්තා.තාම ඒ අයට ව්‍යාපාරයක් කරගන්න නොහැකි වුණා.දොර ජනෙල්, බිම ,විදුලිය අවශ්‍ය නම් තාක්ෂණික නිලධාරි අධීක්ෂණය යටතේ අළුත්වැඩියා කටයුතු සිදු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.**

කඩ කාමර අතුරු බදු දෙනවා.ඊට පස්සෙ ඒවායේ අයිතිකාරයෝ වෙනවා.සභාව මැදිහත් වෙලා අළුත්වැඩියා කරලා ලබා දෙන්න කියලා මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සභාවට මුදල් නොමැති කම නිසා සභාවට අදාළ අළුත්වැඩියා කටයුතු කරන්න අපහසුයි.මේ දිනවල කඩවල් වලට බිස්නස් නෑ. ඒ නිසා ගෙවන මාසික කුලී මුදලින් 50% ක් අඩු කිරීම සුදුසු බව සුදුසු බවට ගෙන ආ යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - III .**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ප්‍රාදේශීය සභාව සතු බැකෝලෝඩර් යන්තයේ සහ ටිපර් රථයේ ඉන්දන නොමැති වීම සම්බන්ධයෙන් යන්ත්‍ර ක්‍රියාකරු විසින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 131 - 08-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

මෙම ලිපිය කාර්මික කමිටුවට යොමු කිරීමෙන් පසු ඊළඟ මහ සභාවට යොමු කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඊ) කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම යටතේ පහත සඳහන් කමිටු වාර්තා මහ සභාවේ දැන ගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

I. 2022.07.19 වන දින පැවති ළමා හා කාන්තා කමිටු වාර්තාව.
II. 2022. 07.25 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.
III. 2022.07.25 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරිම.**

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 ජූලි ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) ගරු මහා සභාවේ දැන ගැනිම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 132 - 08-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාගෙන් අවසරයි. සභාවට ඉදිරිපත් කරන ලද 2022 ජූලි මස ආදායම් වියදම් අයකර ගැනිම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව ( එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එන්.රශ්මි සංකල්පනා මැතිනිය.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහා සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන් පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණ සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරිම.**

පී.මධුර කුමාර පියරත්න මැතිතුමා, එච්.බී.නලින් හේරත් මැතිතුමා,ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිනිය, ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න මැතිතුමා යන සභික වරුන් විසින් නොපැමිණෙන බවට දැනුම් දීලා තියෙනවා.

**(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරිම.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - කේ. නදීකා සෙව්වන්දි කරුණාරත්න මැතිනිය.**

සභාපතිතුමනි,සියළු දෙනාගෙන්ම අවසරයි.අක්ෂිලා මහත්මියගේ අභාවය සම්බන්ධයෙන් මගේ බලවත් කනගාටුව ප්‍රකාශ කරනවා.ඇත්ත වශයෙන්ම එතුමිය ඉතාමත් හොඳින් රාජකාරී ඉටු කළ කෙනෙක්.එතුමියට නිවන් සුව ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික -ඒ. අන්වර් සදාක් මැතිතුමා.**

සියළු දෙනාගෙන්ම අවසරයි. අද දින සභාව පවත්වන්න සිදු වුන එක සම්බන්ධයෙන්ඉතාමත්ම කණගාටුයි.මේ වසරේ අපට වේදනාත්මක අවස්ථා 02 ක් වුණා.අපේ උපසභාපතිතුමා අවංකව ඉතා වගකීමෙන් කටයුතු කරපු කෙනෙක්.ඒ වගේම තමා අපේ අක්ෂිලා මහත්මිය අපෙන් මෙපමණ ඉක්මනින් ඈත් වෙයි කියලා හිතුවේ නෑ.මම මේ සම්බන්ධයෙන් මගේ ශෝකය ප්‍රකාශ කරනවා.එතුමියගේ ආගම අනුව නිවන් සුව ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.මේ සොයුරියගේ ආදාහනයට අපි සියළු දෙනාම සම්බන්ධ වෙමු කියන ඉල්ලීම මම සියළු සභිකවරුන්ගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ. මැතිතුමා.**

ඇත්තෙන්ම අක්ෂිලා මහත්මිය ඉතාමත් හොඳින් රාජකාරී කටයුතු කරපු කෙනෙක්.මෙතුමිය අකාලයේ මිය යෑම සම්බන්ධයෙන් මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා.එතුමියට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම තව කාරණයක් මතක් කරන්න කැමතියි. අපේ උප සභාපතිතුමිය සභාවේ කිසිම කාරණයක් සම්බන්ධයෙන් කිසිම අදහසක් ප්‍රකාශ කළේ නෑ.එහෙම බෑ.ඔබතුමියය හිතපු නැති තනතුරක් ලැබුණේ . තනතුරේ වගකිම් ගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ටිකිරි බංඩාර වනසිංහ මැතිතුමා**

අක්ෂිලා මහත්මිය සමඟ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරලා නැති වුණත් ඉතාම කාර්යක්ෂම නිලධාරිනියක්.තිරප්පනේ ප්‍රාදේශිය සභාවට ඒ වගේම තිරප්පනේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට කියා නිම කල නොහැකි පාඩුවක්. එතුමියට නිවන් සුව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජේතිලක මැතිතුමා.</u>**

අක්ෂිලා මහත්මිය අප අතරින් වෙන් වීම සම්බන්ධයෙන් මම මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා.සභාපතිතුමා ඔබතුමා තෙල් ගහලා දර්ශණ මහතා හරහා ඩීසල් ලිටර් 01 ක් රු.800.00 ගානේ විකුණනවා කියලා මට ආරංචි වුණා.ඒක ප්‍රාදේශීය සභාවට හොඳ නෑ.මේ සම්බන්ධයෙන් ඔබතුමා ඉදිරියේදී පිළිතුරක් දෙන්න.තිරප්පනේ වෙළඳ සංකීර්ණයක් හදනවා.ඒකට මේ වෙනකොට 13 දෙනෙක් ලිපි දීලා තියෙනවා.මේක නිසි පටිපාටියට දෙන්න.උප සභාපතිතුමිය පත් කරපු වාර්තාව ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

උප සභාපතිතුමිය පත් කරපු වාර්තාව පලාත් පාලන දෙපාර්තමේන්තුවෙන් තමයි දෙන්නේ.මගේ වාහනයට තෙල් ගහලා තියෙන්නේ කොච්චරක්ද කියලා හොයලා බලන්න.කවදාවත් මම කිසිම කෙනෙක්ගෙන් තේ එකක්වත් බිලා නෑ.උලගල්ල හෝටලයෙන් මට පෞද්ගලිකව එන්න කියලා  කථා කළා.මම ඒත් ගියේ නෑ.බැදීම් ඇති කර ගත්තහම ප්‍රශ්න.සභාවේ සල්ලි නැති නිසා මම මගේ පෞද්ගලික මුදලින් තමා තෙල් ගහගත්තේ.කඩ කාමර වල ප්‍රශ්ණ නිවාස කමිටුවෙන් තමා කරන්නේ.අනික මම දේශපාලන නියෝජිතයෙක්.ඉන්ධන 500L මට මාසෙකට හිමියි.ඒත් හොයලා බලන්න මම පසුගිය මාසවල 200L/ 300L අතර තමා අරගෙන තියෙන්නේ.ඔය කරුණුවල කිසිදු සත්‍යතාවයක් නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා.</u>**

ඇත්තෙන්ම අක්ෂිලා  මහත්මිය  මිය යෑම අපට විශාල පාඩුවක්.එතුමිය නැති එක අපට තදින්ම දැනෙනවා.ඒ වගේම එතුමියට නිවන් සුව ලැබේවායි මම ප්‍රාර්ථනා කරනවා.ඇත්තටම අපි මහජන නියෝජිතයෝ අප් මහජනතාවට සේවය කරන්න බැදිලා ඉන්නවා.මෑතකදී කෙනෙක් වතුර බවුසරයක් ඉල්ලලා තියෙනවා.ඒත දෙන්න බැරි වෙලා තියෙනවා.මේ සඳහා ක්‍රමවේදයක් හදන්න කියලා මම ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.</u>**

මහා සභා විෂය භාර නිලධරි අක්ෂිලා මහත්මිය මාස කිහිපයක් තිස්සේ අසනිප වෙලා අද දින අපෙන් වෙන් වෙලා ගියා. එතුමිය අපට ලොකු සේවයක් කළා.ඒ සම්බන්ධයෙන් මගේ ශෝකය සහ බලවත් කණගාටුව ප්‍රකාශ කරනවා.

ඒ වගේම එක්සත් ජාතික පක්ෂ නායක ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා නති පුද්ගලයෙක් ලෙස ඇවිල්ලා අද දින ජනාධිපති වෙලා මුළු රටම පාලනය කරනවා.එතුමාට මම මගේ සුභාශිංෂණ පිරිනමනවා.ඒ වගේම නාච්චාදූවට කසල බඳුන් 02 ක් ලබා දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්. ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක  මැතිතුමා .</u>**

මහා සභා විෂය භාර නිලධරි අක්ෂිලා මහත්මිය මිය යෑම සම්බන්ධයෙන් මගේ බලවත් ශෝකය ප්‍රකාශ කරනවා.

ඒ වගේම කුඩාගම අළුතින් ඉදිකරපු කාපට් මාර්ගය දැනට තැන් 02 කින් පුපුරලා තියෙනවා.තාක්ෂන නිලධාරි යවලා පරික්සා කරලා අදාළ ආයතන දැනුවත් කරන්න.මම හිතන්නේ පාර හදලා අවුරුද්දක් විතර.මේක ජාතික අපරාධයක්.ටිපර් යන්නෙත් නැතිව පාර පුපුරලා යනවා.මේ සම්බන්ධයෙන්  මහජන විරෝධතා සහිතව මම ලිපයක් ඉදිරියේදී ඉදිරිපත් කරන්නම්.

**<u>ගරු සභාපති - ඩබ්. රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

ඊයේ දිනයේදී අක්ෂිලා මියගේ අවමංගල්‍යයට සහාය  විම සම්බන්ධයෙන් මම සියළුම මහජන නියෝජිතයන්ට සහ කාර්යය මණ්ඩලයට ස්තූතිවන්ත වෙනවා.ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගී වී සහයෝගය ලබා දුන් සියළුම දෙනාටම ස්තූතිවන්ත වන අතර,අද දින සභාවේ වැඩ කටයුතු හමාර කරනවා.ස්තූතියි.

2022.08.10  වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව.11.45   ට පමණ අවසන් විය.